# ලංසු සඳහා ආරාධනයයි (IFB)

**(ශ්‍රී ලංකා රාජ්‍ය අරමුදල් සපයන ව්‍යාපෘති)**

**ආරක්ෂක අමාත්‍යාංශය**

## නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රය තුල ඉදිකරමින් පවතින මහල් 15 කින් සමන්විත රෝහල් ගොඩනැගිල්ලේ සේවාවන් සඳහා අවශ්‍ය කරනු ලබන ඇළුමිණියම් දොර ජනෙල් උපාංග සැපයීම සඳහා වන ලංසු

**යොමු අංකය - DES/04/2021/100(593)**

01 යුද්ධ හමුදා මූලස්ථානයේ යුද්ධ හමුදා ටෙන්ඩර් මණ්ඩල (ප්‍රසම්පාදන) කමිටු සභාපති විසින් පහත විස්තර කර ඇති පරිදි "නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රය තුල ඉදිකරමින් පවතින මහල් 15 කින් සමන්විත රෝහල් ගොඩනැගිල්ලේ සේවාවන් සඳහා අවශ්‍ය කරනු ලබන ඇළුමිණියම් දොර ජනෙල් උපාංග මිලදී ගැනීම" සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. මෙම සැපයුම සඳහා වන ඇස්තමේන්තුගත දළ පිරිවැය (වැට් බදු සමඟ) රු. මිලි 100 කි.

02 ජාතික තරඟකාරි ලංසුකරණ පටිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03 කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

i. ව්‍යාපාර ලියාපදිංචිය.

ii. VAT ලියාපදිංචිය.

iii. ඉංජිනේරු ද්‍රව්‍ය සඳහා වගකීම් සහතිකයේ කෙටුම්පතක්.

04 කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතා ලංසු දත්ත හා සේවායෝජක අවශ්‍යතාවන්හි ඇතුළත් කොට ඇත.

05 මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ යන ලිපිනයේ පිහිටි ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැකි අතර, (දුරකථනය : 011-2339317, 011-2435143) 2021.07.12 වෙනි දින සිට ඕනෑම රාජකාරි දිනයක 0900 පැය හා 1500 පැය අතර පහත සඳහන් ලිපිනයේදි ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැකිය.

ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය,<br>
යුද්ධ හමුදා මූලස්ථානය,<br>
ශ්‍රී ජයවර්ධනපුර,<br>
කොළඹ.

06 ආපසු ගෙවනු නොලබන රුපියල් දොලොස් දහස් පන්සියයක (රු.12,500.00) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021.07.12 වෙනි දින සිට 2021.08.02 වෙනි දින දක්වා 0900 පැය හා 1500 පැය අතර, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ, ප්‍රධාන ගණකාධිකාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකල යුතුය.

07 ලංසු 2021.08.03 වෙනි දින 11.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි පිටපත් දෙකකින් යුතුව යුද්ධ හමුදා කඳවුර, සෙලින්කෝ ගොඩනැගිල්ල, අංක 167/30, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම (2021.08.03 වෙනි දින 11.00 පැයේදි) එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසු කරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08 ලංසු 2021.11.01 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

09 සියලුම ලංසු සමඟ රුපියල් ලක්ෂ නමයක් (රු.900,000.00) ක වටිනාකමකින් යුත් (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද වෙනස් කල නොහැකි කොන්දේසි රහිත හා ඉල්ලූ විට ගෙවිය හැකි බැංකු සුරක්ෂණයක්) ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරය 2021.11.29 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

10 පූර්ව ලංසු රැස්වීම 2021.07.28 වන දින 1000 පැයට යුද්ධ හමුදා රෝහල නාරාහේන්පිට දී පැවැත්වේ.

11 නිශ්කාෂණ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම/සකස් කිරීම සඳහා යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයට ඇතුළු වන සෑම මොහොතකම දින තුනකට (03) (පැය 72 ට) නිල ඉල්ලීම් ලිපියක සහභාගි වන නියෝජිතයන්ගේ විස්තර (නම්, ජා.හැ.ප අංකය /විදේශ ගමන් බලපත්‍රයේ අංකය, පැමිණෙන දිනය, අපේක්ෂිත ලගාවීමේ වේලාව හා වාහන අංකය) ඉදිරිපත් කරන මෙන් ඔබෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.
(ඊමේල් : desahqproc@gmail.com , ෆැක්ස් - 011-2435143, දුරකථනය: 011- 2339317)

ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය<br>
යුද්ධ හමුදා මූලස්ථානය,<br>
ශ්‍රී ජයවර්ධනපුර,<br>
කොළඹ .